# පිළිකාව පිළිබඳ ලංකාවේ වර්තමාන තත්ත්වය



ප්‍රජා විශේෂඥ වෛද්‍ය
**සුරාජ් පෙරේරා**
ජාතික පිළිකා
මර්දන වැඩසටහන
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය
වෛද්‍ය අමාත්‍යාංශය

පිළිකා බෝ නොවන රෝග අතර ප්‍රධාන තැනක් ගන්නා රෝගී තත්ත්වයකි. ලංකාවේ පිළිකා රෝග සඳහා ප්‍රතිකාර කරනු ලබන ප්‍රතිකාර ඒකක මහරගම අපේක්ෂා රෝහල (ජාතික පිළිකා ආයතනය), කරාපිටිය, මහනුවර, අනුරාධපුරය, යාපනය, මඩකළපුව, කුරුණෑගල යන ශික්ෂණ රෝහල්වලත් රත්නපුර සහ බදුල්ල යන පළාත් මහ රෝහල්වලත් වනසේ ලංකාවේ සෑම පළාතකම පිහිටා ඇති අතර 2015 වසරේදී මෙම රෝහල් 09හිම අලුතෙන් පිළිකා රෝගීන් 28,794 දෙනෙකු ලියාපදිංචි වී තිබිණි. වසර 2008 සිට 2015 දක්වා මෙම රෝහල්වල අලුතෙන් ලියාපදිංචි වූ රෝගීන්ගේ විස්තර පහත වගුවේ දක්වා ඇත.

## රජයේ පිළිකා රෝහල්වල අලුතෙන් ලියාපදිංචි වූ රෝගීන් සංඛ්‍යාව

| ප්‍රතිකාර කරනු ලබන ප්‍රතිකාර ඒකක | ලියාපදිංචි වූ වර්ෂය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
| අපේක්ෂා රෝහල - මහරගම | 11,163 | 11,756 | 11,513 | 12,403 | 12,550 | 12,689 | 13,247 | 13,890 |
| ශික්ෂණ රෝහල - මහනුවර | 3,648 | 3,634 | 4,046 | 5,042 | 3,717 | 3,516 | 4,000 | 4,023 |
| ශික්ෂණ රෝහල - කරාපිටිය | 1,764 | 1,866 | 1,793 | 2,193 | 2,158 | 2,455 | 2,479 | 2,394 |
| ශික්ෂණ රෝහල - යාපනය | 412 | 479 | 659 | 1,055 | 1,048 | 1,061 | 1,032 | 1,100 |
| ශික්ෂණ රෝහල - අනුරාධපුර | 712 | 551 | 641 | 698 | 803 | 850 | 1,114 | 1,300 |
| පළාත් මහ රෝහල - බදුල්ල | 753 | 794 | 858 | 1,430 | 2,152 | 2,203 | 1,527 | 2,285 |
| ශික්ෂණ රෝහල - මඩකලපුව | - | 169 | 565 | 727 | 1,094 | 932 | 897 | 900 |
| ශික්ෂණ රෝහල - කුරුණෑගල | 538 | 804 | 806 | 1,174 | 1,122 | 1,042 | 1,238 | 1,680 |
| පළාත් මහ රෝහල - රත්නපුර | 319 | 485 | 636 | 735 | 808 | 767 | 807 | 902 |
| **එකතුව** | **19,309** | **20,538** | **21,517** | **25,457** | **25,452** | **25,515** | **26,341** | **28,474** |

*මෙම වසරේ හෝ පසුගිය වසරේ ලියාපදිංචි වූ රෝගින් අලුතින් රෝගියකු ලෙස ලියාපදිංචි විය හැක.



සමහර අවස්ථාවලදී එකම රෝගියා පිළිකා ප්‍රතිකාර ඒකක කීපයක විවිධ හේතු නිසා අලුත් රෝගියෙකු ලෙස ලියාපදිංචි වීමේ හැකියාවක් ඇති නිසා ඉහත වගුවේ සංඛ්‍යා මදක් වැඩි අගයක් ගෙන ඇත.

සෞඛ්‍ය අමාත්‍යංශයේ ජාතික පිළිකා මර්ධන වැඩසටහන මගින් ජාතික පිළිකා ලේඛනය (National Cancer Registry) පවත්වාගෙන යනු ලබන අතර එම ලේඛනය සකස් කිරීමේදී එක් රෝගියෙකු එම ලේඛනයට ගනු ලබන්නේ එක් වරක් පමණි. මෙම ලේඛනය සකස් කිරීම සඳහා ලංකාවේ සියලුම පිළිකා ප්‍රතිකාර ඒකකවලිනුත්, ව්‍යාධිවේද (Pathology) රසායනාගාරවලිනුත්, මුඛ සහ හනුක ශල්‍ය ඒකකවලිනුත් දත්ත ලබාගෙන විශ්ලේෂණය කරනු ලැබෙයි. ජාතික පිළිකා ලේඛනය ප්‍රකාශයට පත්කිරීමේ සුළු ප්‍රමාදයක් තිබුන ද එම ලේඛනය සඳහා රෝගියෙකු ඇතුලත් කරගනු ලබනුයේ එක් වරක් පමණක් බැවින් එම දත්ත නිරවද්‍ය භාවයෙන් වැඩිය. එම ලේඛනය අවසන් වරට ප්‍රකාශයට පත්කර ඇත්තේ 2009 වර්ෂයේ වාර්තා වූ පිළිකා රෝගීන් සම්බන්ධවයි.

## ශ්‍රී ලංකාව තුළ වර්ෂයකට අලුතින් පිළිකා රෝගීන් හඳුනාගැනීම

| වර්ෂය | සංඛ්‍යාව | දළ පිළිකා අලුතින් හඳුනාගැනීම අනුපාතය (ජනගහනය 100,000කට) |
|---|---|---|
| 1985 | 5,012 | 31.6 |
| 1990 | 6,063 | 35.7 |
| 1995 | 7,325 | 40.4 |
| 2000 | 10,925 | 56.4 |
| 2005 | 13,372 | 67.9 |
| 2006 | 14,080 | 70.9 |
| 2007 | 13,635 | 68.0 |
| 2008 | 16,511 | 81.6 |
| 2009 | 16,888 | 82.6 |

Source: Sri Lanka Cancer Registry, NCCP

## ශ්‍රී ලංකාව තුළ පිළිකා නිසා මරණයට පත් සංඛ්‍යාව


| වර්ෂය | සංඛ්‍යාව | වාර්ෂික දළ පිළිකා මරණ අනුපාතය (ජනගහනය 100,000කට) | සමානුපාතික මරණ අනුපාතය |
|---|---|---|---|
| 1985 | 4,416 | 27.9 | 4.5 |
| 1990 | 4,479 | 26.4 | 4.6 |
| 1995 | 5,710 | 31.5 | 5.5 |
| 2001 | 8,063 | 42.9 | 7.1 |
| 2002 | 7,986 | 42.0 | 7.1 |
| 2003 | 8,393 | 43.6 | 7.3 |
| 2004 | 9,127 | 47.0 | 7.9 |
| 2005 | 9,403 | 47.9 | 7.1 |
| 2006 | 10,386 | 52.3 | 8.8 |
| 2009 | 11,286 | 55.2 | 8.8 |

## ශ්‍රී ලංකාවේ ගැබ්ගෙල පිළිකා තත්ත්වයන්

කාන්තා ප්‍රජනන පද්ධතියේ ගර්භාෂයේ පහළ කොටස ගැබ්ගෙල ලෙස හදුන්වනු ලබන අතර ගැබ්ගෙල ආශ්‍රිතව ඇතිවන පිළිකාව ගැබ්ගෙල පිළිකාව ලෙස හඳුන්වනු ලැබේ.

**Cervical Cancer**

**ස්ත්‍රී ප්‍රජනන පද්ධතියේ දික් කඩක රූප සටහනක්**




ගැබ්ගෙල පිළිකාව ශ්‍රී ලංකාවේ කාන්තාවන් අතර දෙවෙනියට බහුලතම පිළිකාවයි. සාමාන්‍යයෙන් වාර්ෂිකව අලුතෙන් ගැබ්ගෙල පිළිකා රෝගීන් 1000ක් පමණ ශ්‍රී ලංකාවේ හඳුනාගනු ලැබෙයි. ජාතික පිළිකා මර්ධන වැඩසටහන මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ජාතික පිළිකා ලේඛනයට අනුව ගැබ්ගෙල පිළිකා රෝගීන් 879ක් 2009 වර්ෂයේදී හඳුනාගත් අතර එය කාන්තාවන් අතර අලුතෙන් හඳුනාගත් පිළිකා රෝගීන්ගෙන් 9.7%කි.


### ප්‍රධාන පෙළේ පිළිකාවන් - කාන්තා (ප්‍රමාණ සහ ප්‍රතිශතයන්)

| පිළිකා ඇති වූ ස්ථාන | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2005 | 2006 | 2007 | 2008 | 2009 |
| පියයුරු | 1,859 (18.3) | 2,102 (20.6) | 1,914 (18.8) | 2,220 (21.8) | 2,293 (22.2) |
| ගැබ්ගෙල | 881 (8.9) | 934 (9.6) | 732 (7.4) | 858 (8.6) | 879 (8.7) |
| තයිරොයිඩ් ග්‍රන්ථි | 592 (5.6) | 683 (6.4) | 656 (6.1) | 815 (7.4) | 816 (7.4) |
| ඩිම්බකෝෂ | 596 (5.9) | 672 (6.7) | 529 (5.3) | 637 (6.2) | 698 (6.8) |
| ගලනාලය ආශ්‍රිත | 524 (5.5) | 610 (6.4) | 534 (5.6) | 617 (6.4) | 608 (6.2) |
| මුඛ පිළිකා | 377 (3.8) | 390 (4.0) | 398 (4.0) | 477 (4.8) | 520 (5.2) |
| මහාඅන්ත්‍රය හා ගුද මාර්ග ආශ්‍රිත | 353 (3.6) | 372 (3.8) | 405 (4.1) | 508 (5.2) | 517 (5.5) |
| ගර්භාෂ | 237 (2.4) | 268 (2.8) | 263 (2.7) | 397 (4.1) | 397 (4.1) |
| ලියුකේමියා | 257 (2.8) | 257 (2.8) | 275 (2.9) | | 310 (3.2) |
| වසා ග්‍රන්ථි ආශ්‍රිත | 243 (2.5) | 251 (2.5) | 257 (2.6) | 288 (2.8) | |






**Leading 10 cancer sites of females, 2001-2009**




ජාතික පිළිකා ලේඛනයේ දත්ත අනුව 2001 සිට 2009 දක්වා වාර්ෂිකව අලුතෙන් ගැබ්ගෙල පිළිකා රෝගීන්හඳුනාගැනීම ප්‍රස්ථාරගතකළවිට දී, ගැබ්ගෙල පිළිකාව කාන්තාවන් අතර දෙවෙනියට බහුලව වාර්තාවන පිළිකාව ලෙස පවතින බව පැහැදිලිව පෙන්නුම් කරයි. 2009 වසරේ ගැබ්ගෙල පිළිකා වාර්තාවීමේ අනුපාතය ජනගහණයේ කාන්තාවන් 100,000ට අලුතෙන් ගැබ්ගෙල පිළිකා රෝගීන් 8.7කි. (ASR =8.7)

ගැබ්ගෙල පිළිකාව වාර්තාවන වයස් කාණ්ඩ සැලකූවිට වයස අවුරුදු 30ට පසුව ගැබ්ගෙල පිළිකා රෝගීන් අලුතෙන් හඳුනාගන්නා අතර වැඩිම ගැබ්ගෙල පිළිකා රෝගීන් සංඛ්‍යාවක් හඳුනාගන්නේ වයස අවුරුදු 55-59, 60-64 සහ 65-69 වයස් කාණ්ඩවල බව 2009 ගැබ්ගෙල පිළිකා රෝගීන්ගේ දත්ත විශ්ලේෂණය කළ විට පැහැදිලි වේ.




**Year 2008 Age specific rates- Cervix uteri**

### ගැබ්ගෙල පිළිකාව වළක්වාගත හැකි පිළිකාවකි.

බොහෝ දියුණු රටවල ගැබ්ගෙල පිළිකා අවම කරගෙන ඇත්තේ පැප් පරීක්ෂණය මගින් පූර්ව පිළිකා අවස්ථාවේදී හඳුනාගෙන නිසි ප්‍රතිකාරවලට යොමුවීම මගින් ය. වර්ථමානයේදී බොහෝ රටවල් HPV එන්නත ගැබ්ගෙල පිළිකා ඇතිවීම වැළැක්වීම සඳහා හඳුන්වාදෙමින් ඇති අතර එම ක්‍රමවේදය අනාගතයේදී ගැබ්ගෙල පිළිකා අවම කරගැනීමට හේතු වනු ඇත.